ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. } DRP/OP/10/15/03

ඔබේ අංකය / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2025.06.27

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>**ජාතික හැඳුනුම්පත සැකසීමේදී පොලිස් වාර්තාව ඉදිරිපත් කිරීම.**</u>

ජාතික හැඳුනුම්පත නැති වූ අවස්ථාවකදී නැවත ජාතික හැඳුනුම්පතේ අනුපිටපතක් ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී අංක 12 කින් යුතු නව ජාතික හැඳුනුම්පත් අංකයක් නිකුත් වූ ඉල්ලුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පොලිස් වාර්තාවේ අංක 12 කින් යුතු නව ජාතික හැඳුනුම්පත් අංකයම සඳහන් විය යුතු අතර, එවන් ඉල්ලුම්කරුවෙකු ඊට පෙර ලබාගත් V හෝ X අක්ෂරය සහිත ජාතික හැඳුනුම්පත් අංකය පොලිස් වාර්තාව සමඟ ඉදිරිපත් කරන්නේ නම් පොලිස් වාර්තාව නිවැරදි කරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුය.

02) තවද, යම් ඉල්ලුම්කරුවෙකුට පොලිස් පැමිණිල්ල ඉදිරිපත් කරන අවස්ථාවේ ජාතික හැඳුනුම්පත් අංකය අමතක වී ඇත්තම් "අංකය මතක නැත" යනුවෙන් පොලිස් වාර්තාවේ සටහන් වී තිබිය යුතුය.

03) එබැවින්, මින් ඉදිරියට නැති වූ ජාතික හැඳුනුම්පත් නැවත සකස් කරගැනීම සඳහා යොමු කරන ඉල්ලුම්පත් සමඟ ඉදිරිපත් වන පොලිස් වාර්තාවේ ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව සටහන්ව ඇත්දැයි පරීක්ෂා කරන මෙන් සියළුම ග්‍රාම නිලධාරීවරුන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වන අතර පොලිස් පැමිණිල්ලේ මුල් පිටපත මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එම්.එස්.පී.සූරියප්පෙරුම**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ)

පිටපත්:

01. ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
03. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස.
04. පොලිස්පති, පොලිස් මූලස්ථානය - කරු.දැ.ගැ.ස.
05. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
06. සියලුම මාණ්ඩලික නිලධාරීන් (පු.ලි.දෙ.) - කරු.දැ.ගැ.ස. සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා
07. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත පු.ලි.දෙ. සංවර්ධන නිලධාරීන් - කරු.දැ.ගැ.ස./ අ.ක.ස

දුරකථන / தொலைபேசி / Telephone } (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax } (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@drp.lk
වෙබ් / இணையதளம் / Web } www.drp.gov.lk